**ආදරණීය දුවේ පුතේ,**

පුංචි ඔබේ හිතට නැගෙන ලස්සන අදහස් සිතුවම් කරලා අපට එවන්න. මෙවරත් විදෙස් රටවල සිටින අපේ රටේ පොඩිත්තන්ටත් තමන්ගේ සිතුවම් අපට එවන්න පුළුවන්. අරුණලු සිත්තම් ළමා චිත්‍ර තරඟය තුළින් ඒ සිත්තම්වලට තෑගි දෙන්න අපි සූදානම්.

## තරඟ කොන්දේසි (දේශීය/විදේශීය)

| අංශය | වයස් සීමාව | උපන් වර්ෂය | තේමාව | කඩදාසියේ ප්‍රමාණය |
|---|---|---|---|---|
| පූර්ව ප්‍රාථමික | අවුරුදු 04-05 | 2020 / 2021 | තමන් කැමති මාතෘකාවක් | A3 |
| ප්‍රාථමික | අවුරුදු 06 -07 | 2018 / 2019 | තමන් කැමති මාතෘකාවක් | A3 |
| පශ්චාත් ප්‍රාථමික | අවුරුදු 08 -10 | 2015 / 2016 / 2017 | පංති කාමරය | A3 |
| කණිෂ්ඨ | අවුරුදු 11 -13 | 2012 / 2013 / 2014 | ශ්‍රමදානය | අඟල් 14× අඟල් 18 |
| ජ්‍යෙෂ්ඨ | අවුරුදු 14 - 16 | 2009 / 2010 / 2011 | මගේ සිහිනය | අඟල් 14× අඟල් 18 |

1. චිත්‍ර තරඟය සඳහා එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් චිත්‍රයක් පමණි.
2. දේශීය අංශයේ ජයග්‍රාහකයන් තෝරා ගැනීමේදී පළාත් මට්ටමෙන් තෝරාගන්නා ජයග්‍රාහකයින්ගෙන් ජාතික මට්ටමේ ජයග්‍රාහකින් තෝරාගනු ලැබේ.
3. විදෙස් අංශය සඳහා තරඟ කල හැක්කේ දෙමාපියන් සමඟ විදෙස් රටවල පදිංචි ශ්‍රී ලාංකික දරුවන්ට පමණයි.
4. තමන් කැමති ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකි අතර ඇලෙන සුළු, නොවේලෙන තීන්ත වර්ග භාවිතා නොකළ යුතුයි.
5. දේශීය නිර්මාණ අංශයෙන් තරඟයට ඉදිරිපත් කර ඇති ඔබගේ චිත්‍රය අවසන් වටයට තේරුණහොත් හෝ ජයග්‍රහණය කළහොත් අප දැනුම්දුන් විටෙක එහි මුල් චිත්‍රය විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, නිතීඥ, ග්‍රාම නිලධාරී යන අයගෙන් කෙනෙක් සහතික කර අප වෙත ඉදිරිපත් කළ යුතුයි.
6. විදේශ නිර්මාණ සඳහා එම පාසලේ විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පති සහතික කරන ලද මුල් චිත්‍රයත් අප විසින් ලබාදෙන උපදෙස් අනුගමනය කරමින් අප වෙත ලැබීමට සැලැස්විය යුතුයි.
7. ඔබ විසින් ඉදිරිපත් කරන චිත්‍රය ස්වයං නිර්මාණයක් විය යුතුයි. එය වෙනත් තරඟයකට ඉදිරිපත් නොකළ චිත්‍රයක් විය යුතු අතර නැවත ඇඳීම හෝ අන්සතු කිරීම නොකළ යුතුයි.
8. චිත්‍ර තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නිර්මාණවල අයිතිය කොමර්ෂල් බැංකුව සතුවන අතර ඒවා නැවත භාර දෙනු නොලැබේ.
9. ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ජයග්‍රාහී ස්ථාන, ත්‍යාග සහ සහතික පත්‍රවලට සුදුස්සන් තෝරාගනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
10. මෙම තරඟය සඳහා කොමර්ෂල් බැංකුවේ කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන්ට සහභාගි විය නොහැකිය.

## ඔබගේ නිර්මාණ අප වෙත එවිය යුතු ක්‍රමය

- 2025 ජූලි 15 සිට අගෝස්තු 31 දක්වා www.arunalusiththam.lk වෙබ් අඩවියට චිත්‍රයෙහි ස්කෑන් (scan) පිටපත Jpeg ආකෘතියෙන් මෙගා බයිට් 5ට (5Mb) නොවැඩි) සහ අදාළ විස්තර ඇතුළත් කරන්න.
- වෙබ් අඩවියෙහි ඇති ආකෘති පත්‍රයේ තරඟකරුගේ/ තරඟකාරියගේ සම්පූර්ණ නම, උපන් දිනය, ලිපිනය, පාසල සහ එහි ලිපිනය, මව/පියා/ භාරකරුගේ නම, විද්‍යුත් ලිපිනය, දුරකථන අංකය(ජංගම) සඳහන් කර එවිය යුතුය.

## ත්‍යාග සහ සහතික පත්‍ර

<u>දේශීය චිත්‍ර</u>

- **ජාතික මට්ටමේ ඇගැයීමේදී සියලුම අංශ සඳහා** - ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙලින්, රුපියල් 100,000/ රුපියල් 75,000/ රුපියල් 50,000 බැගින් වූ මුදල් හා සහතික පත්‍ර ප්‍රදානය කෙරේ.
- **පළාත් මට්ටමේ ඇගයීමේදී සියලුම අංශ සඳහා** -ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙලින් රුපියල් 25,000/ රුපියල් 15,000/ රුපියල් 10,000/ බැගින් වූ මුදල් හා සහතික පත්‍ර ප්‍රදානය කෙරේ. පළාත් මට්ටමේ සිව්වන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා සහතික පත්‍ර පිරිනැමේ.
- දිස්ත්‍රික් මට්ටමෙන් වැඩිම නිර්මාණ ඉදිරිපත් කරන පාසල් සඳහා රුපියල් 50,000 බැගින් වූ මුදල් ත්‍යාග ප්‍රදානය කෙරේ.

<u>විදේශීය චිත්‍ර</u>

- සියලුම තරඟ අංශ සඳහා එක් ජයග්‍රාහකයකුට/ජයග්‍රාහිකාවකට මුදලින් රු. 50,000ක් හා සහතික පත්‍රයක් පිරිනමනු ලැබේ.

රු. මිලියන 4.8 ක ත්‍යාග දිනාගන්න. සියළුම මුදල් ත්‍යාග කොමර්ෂල් බැංකුවේ අරුණලු ළමා ඉතුරුම් ගිණුම් වෙත බැරකරනු ලැබේ.

මුදල් ත්‍යාග ජයග්‍රහණය කරන අරුණලු/ඉසුරු ගිණුම් හිමියන්ට සුවිශේෂී අමතර තෑගි රැසක්

වැඩි විස්තර සඳහා 1316 අමතන්න.

www.plusinfo.lk